# 13 ගිහි කැඳවීම



13.1 රූපය - අපට උදව්වන අය

මෙම පින්තූරවල සිටින්නන් පොදු ජනතාවට සේවය කිරීමට තම තමන්ගේ හැකියා අනුව වෘත්තීන් තෝරා ගත් අය ය. ඒ අය එම සේවාවන් කරන්නේ රැකියාවක් වශයෙනි. එහෙත් අප කිතුනුවන් වශයෙන් කැපවීමෙන් අන් අයගේ යහපත සඳහා සේවය කිරීමට කැඳවනු ලබයි. එලෙස කැඳවනු ලබන්නේ ප්‍රසාද ස්නාපයෙනි.

ප්‍රසාද ස්නාපනයේ දී අපි ක්‍රිස්මා තෛලයෙන් ආලේප කරනු ලැබ රජවරුන් දිවැසිවරුන් හා පූජකයන් ලෙස වගකීම් ලබමු. එම ආලේප කිරීම මගින් අපි;

1. එඬේරික (රාජකීය)
2. පූජක
3. දිවැසිවර

යන තුන් ආකාර සේවාවන්ට කැඳවනු ලබමු. ඒ අනුව සැම කිතුනුවෙක් ම ප්‍රසාද ස්නාපනය ලැබීම තුළින් ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීම දයක ප්‍රේමය කිතුනු සංඝයට ගෙන යන පොදු පූජක කැඳවීම ලද අයෙක් වෙයි.

පොදු පූජකවරය ලැබුවෝ ක්‍රිස්තුන් වහන්සේගේ පූජක, එඬේරික හා දිවැසිවර කාර්යයෙහි පංගුකාරත්වය ලබති. රදගුරුතුමන්ලා, පූජකතුමන්ලා, තේවාචාර්යවරුන් හා පැවිදිවරුන් හැර ප්‍රසාද ස්නාපනය ලැබූ සෙසු අය ගිහියෝ වෙති. ගිහි ජනතාව එදිනෙදා ජීවිත කටයුතු තුළින් දේව රාජ්‍ය මෙලොව පතළ කිරීමට වෙහෙසෙති. පූජකවරය නමැති දේව ප්‍රසාද නිධානය ලැබුවෝ නිල පූජකවරු වෙති.

හත්වන ශ්‍රේණියේ දරුවන් හැටියට ඔබට පොදු පූජකවරයෙන් පැවරෙන කැඳවීම් ඉටු කිරීමට කළ හැකි කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

| දිවැසිවර | පූජක | එඬේරික |
|---|---|---|
| • දේව වචනයට සාක්ෂි දැරීම<br>• සත්‍යය ප්‍රකාශ කිරීම<br>• දිනපතා ශුද්ධ බයිබලය කියවීම<br>• දේව වාක්‍ය කියවීම<br>• සමාජය තුළ දැහැමිබවට හා සාධාරණත්වයට සාක්ෂි දැරීම | • එකිනෙකා වෙනුවෙන් යැදීම<br>• පූජා උදව් සමිතියට බැඳී සේවය කිරීම<br>• ජනවන්දනා පිළිවෙත්වලට භක්තියෙන් සහභාගි වීම<br>• ජනවන්දනාව අර්ථවත් ව කිරීමට පියතුමාට සහාය වීම<br>• ගායනා කණ්ඩායමෙහි ක්‍රියාකාරී සාමාජිකයකු වීම | • ආගමික සමිති සමාගම්වල නිලතල භාර ගෙන වගකීමෙන් කටයුතු කිරීම<br>• පාසල්වල නායකත්වය ගනිමින් සේවය කිරීම<br>• දහම් පාසල්වල කටයුතුවලට සහාය වීම<br>• අසරණ අයට යහපත සැලසෙන ස්වේච්ඡා, ශ්‍රමදාන කටයුතු සංවිධානයට සහාය වීම |

## පොදු පූජකවරයෙන් පැවරෙන වගකීම් ඉටුකිරීමට සහාය වන සමිති සමාගම්

එකිනෙකා වෙනුවෙන් යැදීම

ජේසුස් වහන්සේගේ ආදරය අන් අයට බෙදා දීම

ආදර්ශවත් ජීවිතයක් ගත කිරීම

සාංඝික ජීවිතයකට සාක්ෂි දැරීම

ධර්මදූත ළමා සමාජය

දේවස්ථානය පිරිසිදු ව තබා ගැනීම

දිව්‍ය පූජාවට භක්තියෙන් උදව් වීම



පූජා උදව් සමිතිය

පිරිසිදු ඇඳුමෙන් දිව්‍ය පූජාවට උදව් වීම

දේව ප්‍රසාද නිධාන දානය කිරීමේ දී පියතුමාට සහාය වීම

මනා පෞරුෂයක් ගොඩනගා ගැනීම

දේව රාජ්‍යයේ සේවය සඳහා තම හැකියා දියුණු කර ගැනීම

ළමා ක්‍රියාකාරී වීරයෝ

ශ්‍රමදාන කටයුතුවලට සහභාගි වීම

ආගම් භේදයකින් තොර ව සුහද ව කටයුතු කිරීම

ජනවන්දනාව අර්ථවත් කිරීම සඳහා ගායනයෙන් හා වාදනයෙන් සහාය වීම

නිසි පුහුණුවකින් යුතුව ගායනා කිරීම



ගීතිකා කණ්ඩායම

දේව වචනය කියවීමට සහාය වීම

තම හැකියා දක්ෂතා දේව ප්‍රශංසාව සඳහා යොදා ගැනීම



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මෙම ගීතිකාව කටපාඩම් කරගන්න.

යන්නට ජේසුගෙ අඩිපාරේ - එතුමන් හට කරනට සේවේ
ඒ වෙනුවෙන් පුදනට ජීවේ - උගනිමු අපි සැම සවිය යොද

දෙස බස ගැන ආදරවන්න - ගම දියුණුව ගැන වෙහෙසෙන්න
මිතුරුකමින් එකමුතු වන්න - උගනිමු අපි නිති සතුට වඩා

(කිතුනු ළමා ගී - අංක 9)

## ක්‍රියාකාරකම

1. පොදු පූජකවරයෙන් ඔබට පැවරෙන වගකීම් ලියා, ඒවා ඉටු කිරීම සඳහා ඔබ තෝරා ගන්නා මීසමේ ක්‍රියාත්මක වන සමිතියක් නම් කරන්න.
2. පොදු පූජකවරයෙන් පැවරෙන වගකීම් ඉටු කරන ආකාරය කරුණු **හයකින්** ලියන්න.
3. මීසමේ ක්‍රියාත්මක සමිති සමාගම්වලින් ඔබ එක්වීමට කැමති සමිතියක් නම් කර එයට කැමති වීමට හේතුව ලියන්න.



**ජීවිතයට බිඳක්**

*මීසමේ ඇති ළමා සමිති සමාගම්වලට බැඳී සේවය කරන්න.*